www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## 2010 ශ්‍රී ලංකාවේ මහ මැතිවරනය සඳහා සසප ප්‍රතිපත්ති ප්‍රකාශනය

# සමාජවාදී පිලිවෙත් හා කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා

### SEP manifesto for the 2010 Sri Lankan general election
### For Socialist policies and a workers' and farmers' government

සමාජවාදී සමානතා පක්ෂය විසිනි
2010 මාර්තු 25

අප්‍රේල් 08 දින පැවැත්වෙන මහ මැතිවරනයේදී සිය අපේක්ෂකයන්ට සහයෝගය දෙමින්, පක්ෂයේ මැතිවරන ව්‍යාපාරයට ක්‍රියාශීලීව සහභාගී වන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටියි. කොලඹ, යාපනය, නුවර එලිය හා ගාල්ල දිස්ත්‍රික්ක සඳහා සසප සිය අපේක්ෂක ලැයිස්තු ඉදිරිපත්කර තිබේ.

වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කරන්නේ සසප පමනි. ධනේශ්වර පක්ෂවලින් බිඳී වෙන්වී ස්වාධීනව බලමුලු ගැන්වෙමින්, කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සහ සමාජවාදී ප්‍රතිපත්ති සඳහා සටන් නොවදිනාතාක් දුරට කම්කරුවන්ට මුහුන දීමට සිදුවන්නේ සමාජ හා ආර්ථික ව්‍යසනයකට යයි අපි අනතුරු අඟවන්නෙමු.

දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය නිරතව සිටින්නේ, වර්තමාන ආර්ථික අර්බුදයේ පරිමාව හා ආන්ඩුවේ පොලිස් රාජ්‍ය පියවරයන්ගේ වැඩිදියුනු ස්වභාවය වසං කිරීම මගින් සුරක්ෂිතභාවය පිලිබඳ ව්‍යාජ මනෝගතියක් තුල ඡන්දදායකයන් නිදිගැන්වීමේ උත්සාහයකය. මැතිවරනය අවසන් වීමත් සමගම ජනාධිපති මහින්ද රාජපක්ෂ, වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් මත පෙර නොවූ විරූ ප්‍රහාරයක් දියත් කරමින් ඕනෑම විරුද්ධත්වයක් කුරිරු ලෙස මඬිනු ඇත.

එල්ටීටීඊයට එරෙහි යුද්ධය අවසන්වූ පසුව සාමයේ හා සෞභාග්‍යයේ නව යුගයක් උදාකරන බවට රාජපක්ෂ බේගලයක් දෙසා බැවේය. සැබවින්ම සිදුව ඇත්තේ එල්ටීටීඊ පරාජයෙන් පසුව දිවයිනේ ආර්ථික හා දේශපාලන අර්බුදය තව දුරටත් උත්සන්න වීමයි. එය, ගෝලීය ආර්ථික අර්බුදයේ නව අවධිය සමග සම්පාතවී තිබේ.

1930 ගනන් වලින් පසුව ඇතිවූ දරුනුම මූල්‍ය බිඳවැටීම හමුවේ වසර 2008-2009 දී ලෝකය පුරාම ආන්ඩු, ඇපදීම්, උත්තේජක වැඩසටහන් හා මූල්‍ය සහතිකවීම් හරහා ඩොලර් ට්‍රිලියන ගනනක පුද්ගලික නය කන්දරාවක් සිය ගිනුම් පොත් වලට ඇතුලත්කර ගත්තේය. මෙම දැවැන්ත නය කන්දරාව වැඩකරන ජනතාව මත පැටවිය යුතුව ඇතැයි සංගත ප්‍රභූහු දැන් කියා සිටිති.

වහාම අවධානය යොමු කර ඇත්තේ ග්‍රීසිය වෙතය. එහි දී, මූල්‍ය ප්‍රාග්ධනය බලකර සිටින්නේ, ලෝකයේ මූල්‍ය වංශාධිපතියන්ගේ සමපේක්ෂනය හා ගසාකෑම වෙනුවෙන් ගෙවීම සඳහා අගමැති පැපැන්ද්‍රියෝගේ ආන්ඩුව වැටුප් කප්පාදුව, විශ්‍රාම වයස් සීමාව ඉහල නැංවීම, බදු වැඩිකිරීම, අධ්‍යාපනය, සෞඛ්‍ය හා සුභසාධන වියදම් කපා හැරීම කල යුතු බවයි. එනම්, කොටින් කියතොත් කම්කරු පන්තිය දුගීභාවයට හෙලිය යුතු බවයි. කෙසේ වෙතත් ග්‍රීසිය, යුරෝපය පුරා ද ජාත්‍යන්තරව ද ක්‍රියාවට නැගීමට නියමිත න්‍යාය පත්‍රයේ උරගලක් වනවා පමනි.

මෙරට තුල එම ක්‍රියාවලීන්ම දැන් වඩාත් ඉහල මට්ටමකට ලඟාවී තිබේ. ජනාධිපති රාජපක්ෂ, සිය යුද්ධය සඳහා දැවැන්ත ලෙස නය ගත්තේ, 2005 හා 2009 අතර වසරවල රාජ්‍ය නය රුපියල් ට්‍රිලියන 4.1 (එ.ජ. ඩොලර් බිලියන 36 ක්) නැතහොත් දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 86 දක්වා, දෙගුනයකින් ඉහල නංවමිනි. පසුගිය වසරේදී අයවැය හිඟය දදේනි සියයට 9.7 ක් දක්වා පිම්බුනු අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) ලබන වසර අවසානය වන විට අයවැය හිඟය හරි අඩකින් කපාහැර සිය නය කොන්දේසි ඉටුකරන ලෙස දැන් ආන්ඩුවට බල කරයි.

මීලඟ ''ආසියානු විශ්මයේ'' අද්දරටම පැමින ඇතැයි යන ආර්ථිකය පිලිබඳ මුලුමනින්ම සාවද්‍ය චිත්‍රයක් රාජපක්ෂ ගෙනහැර පායි. ජාමූඅ විසකුරු ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීම කල් දැමීමේ උපායක් ලෙස ඔහු අයවැය කල්තැබීය. කෙසේ වෙතත් මැතිවරනය අවසන්වූ වහාම, කම්කරු පන්තිය මත දරුනු ප්‍රතිවිපාක ඇතිකරන අයවැයක් ඔහු ගෙනඑනු ඇත.

මේ වන විට ආන්ඩුවේ සමස්ත වියදමෙන් හරි අඩකටත් වඩා වැයවන්නේ සියයට 35 ක් වන නය ආපසු ගෙවීමට හා සියයට 21ක් වන ආරක්ෂක කටයුතු වලටය. ආන්ඩුවට පලමු අයිතමය කපාහල නොහැකි අතර දෙවැන්න කපා නොහරිනු ඇත. එහි ප්‍රතිපලය ලෙස, සමස්ත ජීවන තත්වයන් බරපතල ලෙස පහත හෙලීමට තුඩුදෙමින් කප්පාදුවේ මුලු බර, මිල සහනාධාර, අධ්‍යාපනය, සෞඛ්‍යය. ශුභසාධන හා රාජ්‍ය අංශයේ වැටුප් හා දීමනා මත පැටවෙනු ඇත.

විරුද්ධ පක්ෂ කිසිදු විකල්පයක් ඉදිරිපත් නොකරති. එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වර්තමාන ආර්ථික දුෂ්කරතාවන්ට එකම හේතුව ''ආන්ඩුවේ දූෂනය'' යන ජනප්‍රිය බෙගලය පතුරුවා හරිමින් සිටිති. ගැඹුරුවන ආර්ථික අර්බුදයේ බර කම්කරු පන්තිය මත හෙලීම හැර වෙනත් විකල්පයක් තමන්ට නැත යන ආන්ඩුවේ ආස්ථානය සමග එකඟවන බැවින් ඔවුහු, සැබෑ තත්වය වසං කරති.

## ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි ප්‍රහාර

ග්‍රීක ප්‍රතිකර්මය ශ්‍රී ලංකාවට ද යෙදීමෙන් කම්කරු පන්තිය සමග ගැටුමක් නොවැලැක්විය හැකි බව දන්නා රාජපක්ෂ ඒ අනුව සූදානම් වෙයි. වෘත්තීය සමිතිවල සහයෝගය ද ඇතිව යුද්ධය අවධියේ ආන්ඩුව, ''ජාතික ආරක්ෂාවේ'' නාමයෙන් කම්කරුවන්ගේ අරගල රැදුරු ලෙස මැඩපැවැත්වීය. දැන් රාජපක්ෂ එම මර්දනකාරී යාන්ත්‍රනයම යොදා ගනිමින්, ''ජාතිය ගොඩනැගීමේ ආර්ථික යුද්ධයක්'' ගෙනයයි. පසුගිය වසර පුරාම වතුකරය, වරාය, රෝහල් හා අනෙකුත් ක්ෂේත්‍රයන්හි කම්කරුවන් අතර කෝපය දලුලමින් තිබුනු තත්වය හමුවේ, වර්ජකයන්ට එරෙහිව ඔහු හමුදාව යෙදවූ අතර වෘත්තීය ක්‍රියාමාර්ග තහනම් කිරීම සඳහා සිය හදිසි නීති බලතල යොදා ගත්තේය.

කොලඹ බලයට පැමිනි ආන්ඩු සිවිල් යුද්ධය ගෙනයාම පිනිස දැවැන්ත පොලිස් රාජ්‍ය යාන්ත්‍රනයක් ගොඩනැංවූහ. රාජපක්ෂ, තවත් දුර ගමන් කරමින්, සිය පුලුල් විධායක බලතල වඩ වඩාත් යොදා ගත්තේ, පාර්ලිමේන්තුව රබර් මුද්‍රාවක් බවට පිරිහෙලා, අධිකරනය නොතැකූ හා ව්‍යවස්ථාව උල්ලංඝනය කල දේශපාලන-මිලිටරි කල්ලියක් හරහා ක්‍රියාත්මක වීමටයි. ඔහුගේ තන්ත්‍රය යටතේ, නිදහසේ සැරිසැරූ ආන්ඩු ගැති ඝාතක කල්ලි සිය ගනනක් මිනිසුන් මරාදමා හෝ ''අතුරුදහන්'' කර ඇත. එල්ටීටීඊ පරාජයෙන් පසුව හමුදාව, 280,000 ක් දෙමල සිවිල් වැසියන් ''ශුභසාධක ගම්මාන'' තුල නීති විරෝධි ලෙස සිරගත කලහ. වැඩකරන ජනතාව සිය ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂාකර ගැනීමට දරන උත්සාහයේදී ඔවුන්ට එරෙහිව ද ඒ හා සමාන ක්‍රමවේදයන් යොදාගන්නවා ඇත.

මෙම මැතිවරන ව්‍යාපාරය දිගහැරෙන්නේ, විපක්ෂ දේශපාලඥයින්ට, මාධ්‍ය විචේචකයන්ට හා වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ට එරෙහිව යෙදෙන බියවැද්දීම් හා ප්‍රචන්ඩත්වයේ වාතාවරනයක් තුලය. ජනවාරියේ පැවති ජනාධිපතිවරනයෙන් පසුව, ආන්ඩුව, කුමන්ත්‍රනයක යෙදී සිටියේය යන ව්‍යාකූල හා සාක්ෂි රහිත චෝදනා යටතේ විපක්ෂයේ අපේක්ෂකයාවූ හිටපු ජෙනරාල් සරත් ෆොන්සේකා හා ඔහුගේ ආධාරකරුවන් දුසිම් ගනනක් සිරගත කලේය. මහ මැතිවරන ව්‍යාපාරය තුල රාජපක්ෂ දැන් යෙදීගෙන සිටින්නේ, ඔහුගේ ආඥාදායක පාලනය ශක්තිමත් කලහැකි පරිදි ව්‍යවස්ථාව වෙනස්කිරීමට අවශ්‍ය තුනෙන් දෙකක බහුතරයක් ලබාගැනීමටයි.

එජාප හා ජවිපෙ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ගේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටිති. එහෙත් ඔවුහු, ''එල්ටීටීඊ සැකකරුවන්'' ලෙස රඳවා සිටින දහස් ගනනක් දෙමල තරුනයන් වහාම නිදහස් කරන ලෙස හෝ හමුදාවේ ''ශුභසාධක ගම්මාන'' හා රැඳවුම් කඳවුරු වසාදමන ලෙස ඉල්ලා සිටින්නේ නැත. ආන්ඩුව මෙන්ම විරුද්ධ පක්ෂ ද දෙමල විරෝධී ස්වෝත්තමවාදයේ කරවටක් ගිලී සිටිති. ඔවුහු, මිලිටරියේ යුද අපරාධවලට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීම්වලට මෙන්ම රාජපක්ෂගේ සාපරාධී යුද්ධයට ද පිටුබලය දුන්හ.

ආන්ඩුව හා විරුද්ධ පක්ෂ අතර හටගෙන තිබෙන කටුක කුලල් කාගැනීම් තනිකරම උපායාත්මක ප්‍රශ්න, විශේෂයෙන්ම විදේශ පිලිවෙත මත, හටගත් ඒවාය. දකුනු ආසියාව මහා බලවතුන් අතර එදිරිවාදිකම් තුලට වඩ වඩාත් ඇදී යමින් තිබේ. මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ බලශක්තියෙන් පොහොසත් කලාපයන්හි සිය අධිකාරය සුරක්ෂිත කරගැනීම සඳහා එක්සත් ජනපදය, ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල නව යටත් විජිත යුද්ධ වලද පකිස්ථානය ලවා එරට තුල ගෙනයන යුද්ධයක ද යෙදී සිටියි. ඉන්දියානු සාගරය හරහා දිවෙන සිය වැදගත් වෙලඳ මාර්ග සුරක්ෂිතකර ගැනීම ද ඇතුලු සෑම ක්ෂේත්‍රයකදීම චීනය, එක්සත් ජනපදයට අභියෝග කිරීමට උත්සාහ කරයි.

රාජ්‍යතාන්ත්‍රික, මූල්‍ය හා මිලිටරි ආධාර සඳහා රාජපක්ෂ බිජිනය වෙත නැඹුරුවීම, වොෂින්ටනය තුල වැඩෙන තැතිගැන්මක් ජනිතකර තිබේ. පසුගිය වසරේ පලවූ එක්සත් ජනපද සෙනේට් සභා වාර්තාවක සඳහන් වූයේ, ඉන්දියානු සාගරයේ මූලෝපායිකව වැදගත් තැනක පිහිටි ''ශ්‍රී ලංකාව අහිමිකර ගැනීම'' එරටට දැරිය නොහැකි බවයි. රාජපක්ෂ චීනය වෙත නැඹුරුවන අතර එජාප, එක්සත් ජනපදය හා යුරෝපය යන රටේ සම්ප්‍රදායික මිතුරන් කෙරෙහි වැඩි ඇල්මක් දක්වයි. ගෝලීය ආර්ථික අර්බුදය ගැඹුරුවන තතු හමුවේ පැනනැගී තිබෙන අන්තරාය වන්නේ, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය හා ඉරාකය සේ ශ්‍රී ලංකාව ද පුලුල්

එදිරිවාදිකම්, ගැටුම් හා යුද්ධ තුලට ගසාගෙන යනු ඇතැයි යන්නය.

## දේශපාලන පක්ෂසාතය අවසන් කරනු

දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද සිය පන්ති සහෝදරයන් හා සහෝදරියන් සේම මෙරට කම්කරුවන් ද මහත් උපද්‍රවයකට මුහුනදී සිටියි. පාලක පන්තියට පන්ති යුද්ධයේ න්‍යාය පත්‍රයක් ඇතත්, කම්කරු පන්තිය දේශපාලනිකව පක්ෂඝාතව සිටියි. බංකොලොත් ලාභ පද්ධතිය ආරක්ෂා කරන හා ජීවන තත්වයන්ට ද ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට ද පහර එල්ල කරන දේශපාලන පක්ෂ හා සංවිධාන වලට කම්කරුවෝ ගැටගැසී සිටිති. සිංහල වේවා දෙමල වේවා ඒ සියල්ල විවෘතවම ධනපති පක්ෂය. කම්කරු පන්තිය මුලාකිරීම සඳහා ක්‍රියාකරන වෘත්තීය සමිති හා නව සමසමාජ පක්ෂය ද (නසසප) එක්සත් සමාජවාදී පක්ෂය ද (එසප) වැනි හිටපු වම්මු ඒවාට මුක්කුව දෙති.

තියුනු දේශපාලන පාඩම් උකහා ගැනීමට දැන් කාලය එලඹ තිබේ. පසුගිය දශක තුන පුරාම සිදුව ඇත්තේ, දේශපාලන පක්ෂවලට ගැටගැසුනු හෝ ස්වාධීන යයි කියාගත් වෘත්තීය සමිතිවල ද්‍රෝහීත්වය ගැඹුරුවීම පමනි. පසුගිය සිව් වසර පුරා පැනනැගුනු සෑම අරගලයකදීම, සෑම සමිතියක්ම රාජපක්ෂ ආන්ඩුවේ හා මහා ව්‍යාපාරිකයන්ගේ නියෝග ක්‍රියාවට නැගීම සඳහා ක්‍රියාත්මක වූහ. ආන්ඩු ගැති වෘත්තීය සමිති ඍජුවම මේ කාර්යයෙහි නිරතවූ අතර ''විපක්ෂ'' සමිති සේවය කොට ඇත්තේ කම්කරුවන්ගේ කෝපය යටපත්කර වාෂ්පකර හරින ආරක්ෂක කපාටයන් ලෙසය. ඔවුන්ගේ ඉදිරිදර්ශනයෙහි හරිමැද ඇත්තේ, මෙරට ධනවාදය ආරක්ෂා කිරීමත්, මෙරට සමාගම්වල ''ජාත්‍යන්තර තරගකාරිත්වය'' පවත්වා ගැනීමත්ය.

එල්ටීටීඊයේ පරාජය මූලිකවම එහි මිලිටරි උපායන්ගේ නොව, එහි දේශපාලන බංකොලොත්භාවයේ ප්‍රතිඵලයක් බව දෙමල කම්කරුවන් හා තරුනයන් වටහා ගැනීම තීරනාත්මක ය. කම්කරු පන්තිය බෙදීම සඳහා දෙමල විරෝධී වෛරය ඇවිස්සූ සෑම කොලඹ ආන්ඩුවක්ම 26 වසරක යුද්ධය සඳහා වගකිව යුතුය. එහෙත් එල්ටීටීඊයේ වෙනම දෙමල ධනේශ්වර රාජ්‍යයක් පිලිබඳ ක්‍රියාමාර්ගය නියෝජනය කලේ දෙමල මහජනතාවගේ නොව දෙමල ධනේශ්වරයේ අවශ්‍යතාවන්ය. දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමට සමත් එකම සමාජ බලවේගය වූ, එනම්, මෙරට, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙත කිසිදු පන්ති ආයාචනයක් කිරීමට එල්ටීටීඊය ඓන්ද්‍රියවම අසමත් වූයේය.

යුද්ධය අවධියේ එල්ටීටීඊ හොරනෑව ලෙස කටයුතු කල දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) අඩුම තරමින් කොටස් හතරකට බිඳී ගොස් ඇත. ඔවුන් සියල්ලන්ගේම බලාපොරොත්තුව වන්නේ, කොලඹ දේශපාලන සංස්ථාපිතයට යලි රිංගා ගැනීමයි. ජනාධිපතිවරනයේදී සමහර ටීඑන්ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රාජපක්ෂ ආන්ඩුවට සම්බන්ධවූ අතර ටීඑන්ඒ, රාජපක්ෂගේ යුද්ධය ගෙනගිය ජෙනරාල්වරයා වූ ෆොන්සේකාට පිටුබලය දුන්නේය. ඔවුන් කිසිවෙකුත් එල්ටීටීඊයේ පරාජයට මඟ පෑදූ දෙමල බෙදුම්වාදී දේශපාලනයෙන් බිඳී වෙන්වී නැත.

විටින් විට සමාජවාදීන් ලෙස ද රංගනයෙහි යෙදුන නමුත් ප්‍රධාන ධනේශ්වර පක්ෂවල වම් ඇලය ලෙස කටයුතු කරන නසසප හා එසප ඉටුකරන භූමිකාව අතිශයින්ම අනතුරු දායකය. ඔවුන්ගේ වත්මන් දිශානතිය යොමුව ඇත්තේ එජාපය වෙතය. ඔවුහු මෙම දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂය ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ගේ ආරක්ෂකයකු ලෙස එය හුවා දක්වති. මෙම සංවිධාන දෙකම පසුගිය වසරේදී ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිලිබඳ හිස් ප්‍රලාප දොඩවමින් එජාප නායකත්වයෙන් යුත් ''නිදහසේ වේදිකාවට'' නැගගත්හ. ඉන්දියාවේ හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයට ( බීජේපී) සිය සහාය පුදකිරීම මඟින් තම දක්ෂිනාංශික නැඹුරුව මොනවට ප්‍රදර්ශනය කර ඇති එම්. කේ. සිවාජිලිංගම්ගේ නායකත්වයෙන් ටීඑන්ඒ වෙතින් බිඳී ගිය කන්ඩායමක් සමග ද නසසප සන්ධානයක් ගොඩනගාගෙන තිබේ.

වත්මන් දේශපාලන පක්ෂඝාතය නිමා කිරීමේ අර්ථය වන්නේ, පාලක පන්තියේ හා ඒවායේ වාම උපාංග වන සියලු පක්ෂ වලින් මූලිකව ම බිඳී වෙන්වීමයි. ශ්‍රී ලංකාවේ ද ලෝකය පුරා ද වැඩකරන ජනතාවන්ගේ ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ගේ හා යුද්ධය දෙසට වන තල්ලුවේ පොදු මූලාශ්‍රය වන්නේ, ලාභ පද්ධතිය හා ලෝකය යල්පිනූ ධනේශ්වර ජාතික රාජ්‍යයන්ට බෙදී පැවතීමයි. එකම විකල්පය සමාජවාදයයිඃ එනම්, මූල්‍ය හා සංගත කතිපයාධිකාරයේ ලාභය නොව, වැඩකරන ජනතාවගේ දැවෙන අවශ්‍යතා, සංසිඳුවියහැකි පරිදි ගෝලීය ආර්ථිකයේ දැවැන්ත සම්පත් තර්කානුකූල ලෙස ප්‍රතිසංවිධානය කිරීමයි.

ගම්බද ජනතාවන්ට නායකත්වය සපයමින් බලය අල්ලාගෙන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් පිහිටුවීම සඳහා කම්කරු පන්තිය බලමුලු ගැන්වීමට සටන් වැදීමේදී සසප පදනම් වන ඉදිරිදර්ශනය මෙයයි. දකුනු ආසියාවේ ද සමස්ත ලෝකයේ ද සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) ගෙනයන අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැගීම සඳහා සසප සටන් වදියි.

වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම සඳහා සසප පහත දැක්වෙන ක්‍රියාමාර්ගය ඉදිරිපත් කරයි.

* උතුරේ හා නැගෙනහිරේ මිලිටරි වාඩිලෑම අවසන් කරනු

උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදා වහාම ඉවත්කරන ලෙසත් සියලු රැඳවියන් හා දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙසත් සසප ඉල්ලා සිටියි. සියලු ආකාරයේ වර්ගවාදයට හා ජාතිකවාදයට විරුද්ධ වීමෙන් පමනක් ධනේශ්වර පාලනයට එරෙහි පොදු අරගලයක් තුල සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් ඒකාබද්ධ කල හැකිය. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී විසඳුමක් සඳහා පදනම සැකසීම සඳහා ව්‍යවස්ථාදායක සභාවක් ස්ථාපනය කල යුතු යයි සසප කියා සිටියි. එය, සියලු නොවිසඳුනු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රශ්න විසඳීම පිනිස ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ඇත. සාමාන්‍ය වැඩකරන ජනතාව විසින් එවන් සභාවක් සංවිධානය කර තෝරාපත් කර ගත යුතු අතර එය අව්‍යාජ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහතික කිරීමට සියලු මර්දනකාරී හා අයුක්ති සහගත නීති අහෝසි කල යුතුය.

*සියල්ලන් සඳහා සුරක්ෂිත හා මනා වැටුප් සහිත රැකියා

මනා වැටුප් සහිත රැකියා ලක්ෂ ගනනින් නිර්මානය කිරීම හා පොදු නිවාස, පාසැල්, රෝහල්, සංස්කෘතික හා ක්‍රීඩා පහසුකම්, මංමාවත් හා වාරිමාර්ග ව්‍යාපෘති ඉදිකිරීම පිනිස පොදු වැඩ සඳහා රුපියල් බිලියන ගනනින් සම්පාදනය කල යුතුය. ජීවන වියදම වැඩිවීමට අනුකූලව වැටුප් ඉහල යාම තහවුරුකොට ඒ සමඟම, වැටුප් පහත නොහෙලන පරිදි, වැඩ සතිය පැය 30 දක්වා අඩු කිරීම මගින් රැකියා අවස්ථා දැවැන්ත ලෙස පුලුල් කල යුතු යයි සසප කියා සිටියි. ළමා ශ්‍රමය ද රාත්‍රී වැඩමුරයන්හි කාන්තාවන් හා තරුනයන් යොදාගැනීම ද අවසන් කල යුතුය.

*නිදහස් හා ඉහල ගුනාත්මක භාවයෙන් යුතු අධ්‍යාපනයක්

අසමානතාව මගින් වත්මන් අධ්‍යාපන ක්‍රමය ඉරිතලා ගොස් තිබේ. කම්කරු පන්තික හා ග්‍රාමීය ප්‍රදේශවල දරුවන් උපකරන හා කාර්ය මන්ඩල හිඟයෙන් පෙලෙන රජයේ පාසැල්වලට කොටුකර තිබෙන අතර ධනවතුන්ගේ දූ පුතුන් පුද්ගලික පාසැල්වල නවීන සම්පත් ද ඉගැන්වීමේ ක්‍රම ද තාක්ෂනය ද පරිහරනය කරති. සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය සියලුදෙනාට විශ්ව විද්‍යාල මට්ටම දක්වා නිදහස් ඉහල ගුනාත්මක අගයෙන් යුතු අධ්‍යාපනයක් ලබාදීම පිනිස රජයේ පාසැල් පද්ධතිය පුලුල් කොට වැඩිදියුනු කල යුතු යයි සසප ඉල්ලා සිටියි. විද්‍යාගාර, පරිගනක පහසුකම්, හා නවීනතම ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකරන මෙන්ම ක්‍රීඩා හා කලාත්මක පහසුකම් ද ලබාදී පවත්නා ආයතන ප්‍රවර්ධනය කල යුතුය.

*සාර්වත්‍රික සෞඛ්‍ය සේවාවක් සඳහා

ඩෙංගු, මැලේරියා, හා ක්ෂයරෝගය වැනි වලක්වාගත හැකි රෝගවලින් වසරක් පාසා දහස් ගනනින් මිය යන අතර සූකර උන හා කුරුලු උන වැනි නව ලෙඩරෝග පැතිර යමින් තිබේ. යමක් කමක් ඇති අය පුද්ගලික වෛද්‍යවරුන් හා සායන වෙත යන අතර මහජනතාව එන්ට එන්ටම අරමුදල් හිඟයෙන් පෙලෙන රජයේ සෞඛ්‍ය සේවාවන් මත රැඳී සිටිති. සාර්වත්‍රික, ඉහල ගුනාත්මක භාවයෙන් යුතු සෞඛ්‍ය සේවාවක් නොමිලයේ සපයනු පිනිස මනා හා ප්‍රමානවත් උපකරනවලින් හා කාර්යමන්ඩලවලින් සමන්විත රජයේ රෝහල් හා සායන වැඩි වර්ධනය කල යුතුය.

*සියලු දෙනාට යහපත් නිවාස

බොහෝ පවුල් නල ජලය, විදුලිය හා මනා වැසිකිලි වැනි මූලික පහසුකම් නොමැති ප්‍රමිතියෙන් බාල නිවාසවල ජීවත්වන අතර නිවාස කුලී ඉහල දැමීමට ද දොට්ට දැමීමේ තර්ජනයන්ට ද මුහුන දී සිටිති. සියල්ලන් සඳහා යහපත් නිවාස පහසුකම් සපයනු පිනිස සියලු අත්‍යවශ්‍ය උපයෝගිතා සේවාවන් සහිත දැරිය හැකි, පාලනය කෙරුනු කුලියක් සහිත රාජ්‍ය නිවාස සංකීර්න ගොඩනැඟිය යුතු යයි සසප ඉල්ලා සිටියි.

*කාන්තා කම්කරුවන් පීඩාවට පත්කිරීම අවසන් කරනු

දරිද්‍රතාව හේතුවෙන් කාන්තා කම්කරුවන්ට බලකෙරී ඇත්තේ අඩු වැටුප් සහිත රැකියා හා ගෘහස්ත කැඹිරීම යන දෙගුනයක බරට කර ගැසීමටය. ඔවුහු ඇඟලුම් කම්හල්වල, තේදලු නෙලීම, රබර් කිරි කැපීම හා සෙසු කෘෂිකාර්මික වැඩ වැනි වඩාත් ම බර වැඩට කරගසති. ගෝලීය ආර්ථික අර්බුදය කාන්තා ඇඟලුම් කම්කරුවන් දස දහස් ගනනකට රැකියා අහිමි කොට, එතෙර සේවය කරන ගෘහ සේවිකාවන්ගේ හෝ සුලු සේවිකාවන්ගේ රැකියා හෝ ආදායම් මාර්ග ඇනහිටුවා ඇත.

නොමිලයේ සැපයෙන ඉහල ගුනාත්මක භාවයෙන් යුතු ළමා සුරැකුම් සේවා හා සම්පූර්න වැටුප් සහිත මාතෘ නිවාඩු ද ඇතුලුව, සමාන වැටුප් හා කොන්දේසි සඳහා කාන්තා කම්කරුවන්ට ඇති අයිතිය සසප ආරක්ෂා කරයි. විවාහ නීති තුල පවත්නා තතු ද ඇතුලුව ලිංග භේදය මත වෙනස්කම් කිරීම අහෝසි කල යුතු යයි අපි ඉල්ලා සිටිමු. ගබ්සාව නීතිගතකොට සියල්ලන් සඳහා එම පහසුකම් නොමිලයේ ලබාගැනීමට අවස්ථාව සැලසිය යුතුය. පිරිමින්ට හා කාන්තාවන්ට එකසේ සිය දක්ෂතා හා පෞරුෂයන් පරිපූර්නව වර්ධනය කරගත හැකි වන ප්‍රබුද්ධ සංස්කෘතික වාතාවරනයක් ප්‍රවර්ධනය කරනු වස් සසප ප්‍රයත්න දරයි.

*සුලු ගොවීන්ට ආධාර කරනු

ඉඩම් නොමැතිකම බොහෝ සුලු ගොවීන්ට බලපාන අතර මෙම ගැටලුව සිවිල් යුද්ධය අවුලුවාලීමෙහිලා සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටුකර තිබේ. මෙතෙක් පැවති සියලු ආන්ඩු හිතාමතාම දෙමල බහුතරයක් සහිත ප්‍රදේශවල, එනම් උතුරේ වන්නි ප්‍රදේශයේ හා නැගෙනහිර ගොවි ජනපදවල ඉඩම් අහිමි සිංහල ගොවීන් පදිංචි කලේ වාර්ගික ආතතීන් උත්සන්න කරමිනි. යුද්ධයේ අවසානයත් සමග මෙම පිලිවෙත් යලි පන ගසමින් තිබේ. කුමන ජාතියකට අයත් වුව ද ඉඩම් නොමැති සියලු ගොවීන්ට රජය සතු ඉඩම් බෙදාදිය යුතු යයි සසප ඉල්ලා සිටියි. දුගී ගොවීන්ගෙන් හා ධීවරයන්ගෙන් අයවිය යුතු සියලු පැරනි නය අහෝසි කල යුතු අතර නය, ගොවි උපකරන, පොහොර හා කෘෂි රසායනික හා ධීවර ආම්පන්න දැරිය හැකි කොන්දේසි යටතේ සැපයිය යුතුය.

මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් ලබාගැනීමට සියලු විශාල බැංකු හා මූල්‍යායතන ජනසතු කිරීමත්, නිදහස් වෙලඳ කලාප තුල පිහිටි ආයතන ද ඇතුලු සියලු ප්‍රමුඛ කර්මාන්ත සංගත පොදු අයිතියට හා ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය වන ව්‍යවසායන් බවට පත් කිරීමත් කල යුතු බවත් අපි කියා සිටිමු. කම්කරුවන් වගකිවයුතු නොවූවත් ඔවුන්ට දැරීමට බලකෙරී තිබෙන ජාත්‍යන්තර බැංකුවලට ගෙවීමට ඇති සියලු නය කටුගා දැමිය යුතුය. ජාත්‍යන්තර බැංකුවල ග්‍රහනය බිඳ දැමීමෙන් තොරව, වැඩකරන ජනතාවගේ අවශ්‍යතාවන් පරිදි ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීමේ දිසාවට පලමු පියවරවත් තැබිය නොහැකිය.

කම්කරුවන් හා තරුනයන් කාර්යභාරය සියතට ගත යුතුය. පසුගිය වසරේ වැටුප් උද්ඝෝෂනය පැවති දිනවල බැල්මොරල් වතුයායේ කම්කරුවෝ සසප දේශපාලන සහයෝගය ඇතිව වෘත්තීය සමිති වලින් ස්වාධීන වෙමින් තමන්ගේම ක්‍රියාකාරී කමිටුවක් ගොඩනගා ගත්හ. වෘත්තීය සමිති වලින් කැඩී වෙන් වෙමින් ලාභ පද්ධතියට හා එහි ආරක්ෂකයන්ට එරෙහිව දේශපාලන අරගලයක් සඳහා බලමුලු ගැන්වී ගැනීමෙහිලා කම්කරු පන්තිය ගත යුතු පලමු වැදගත් පියවර ඔවුන්ගේ එම ක්‍රියාවෙන් සනිටුහන් කෙරුනි.

තම අයිතීන් රැකගැනීම සඳහා වැඩපලවල, කම්කරු පන්තික නිවහන් ප්‍රදේශයන්හි, නගර හා ගම්වල ස්වාධීන ක්‍රියාකාරී කමිටු ගොඩනඟන ලෙස සසප කැඳවුම් කරයි. නාගරික හා ගම්බද ගොවීන්ගේ නායකත්වයෙහි පිහිටා ගනිමින් කම්කරු පන්තියට බලය අල්ලාගත හැකි මහජන දේශපාලන ව්‍යාපාරයක පදනම එවන් සංවිධාන මගින් ගොඩනැගෙනු ඇත.

සියල්ලටමත් වඩා අවශ්‍ය වන්නේ, කම්කරු පන්තිය එහි අරගල තුලදී උගන්වා, මෙහෙයවා බලමුලු ගන්වන දේශපාලන පක්ෂයක් ගොඩනැගීමයි. සසප එම පක්ෂයයි. අද දවසේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තුල දේහානුකරනය වී තිබෙන ජාත්‍යන්තර සමාජවාදයේ එම ශ්‍රේෂ්ඨ මූලධර්ම මත පදනම්වූ පක්ෂය එයයි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, ලෙනින් හා ට්‍රොට්ස්කි 1917 රුසියානු විප්ලවයට නායකත්වය දීමේ දී පාදක වූ ක්‍රියාමාර්ගය ආරක්ෂා කරයි. එනම්, මානව වර්ගයා ධනවාදයෙන් හා පන්ති පරිපීඩනයෙන් විමුක්ත කරගැනීමේ ලෝක සමාජවාදී විප්ලවයයි. සෝවියට් සංගමයේ දේශපාලන බලය පැහැරගෙන, නැගී එන තත්වාරක්ෂක පාලක කුලයක් ලෙස තම වරප්‍රසාද අරක්ෂාකර ගැනීමේ අරමුනු සහිතව ''තනිරටක සමාජවාදය'' නමැති ප්‍රතිමාක්ස්වාදී ඉදිරිදර්ශනය පෙරටුකොටගත් ස්ටැලින්වාදී නිලධරයේ පාවාදීම් වලට එරෙහිව සටන්වැදීම සඳහා 1938 දී ට්‍රොට්ස්කි විසින් හතරවන ජාත්‍යන්තරය ගොඩනගන ලදී. ස්ටැලින්වාදය කෙරෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ විරුද්ධත්වය හා විශ්ලේෂනය පිලිබඳ අවසන් සනාථනය ලඟාවූයේ 1991 වසරේදී ස්ටැලින්වාදීන් සමාජවාදය ප්‍රතික්ෂේප කොට, සෝවියට් සංගමය බිඳ දමා ධනවාදය පුනස්තාපනය කිරීමත් සමගය.

සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා අරගලය පෙරට ගෙන ගිය කම්කරු පන්තියේ ඉතාමත් දුර දක්නා නියෝජිතයන්ගේ උරුමය මත සසප පදනම් වෙයි. 1940 ගනන්වල දී, ඉන්දියානු බොල්ශෙවික් ලෙනින්වාදී පක්ෂයේ (බීඑල්පීඅයි) ට්‍රොට්ස්කිවාදීහු, ඉන්දියානු උප මහාද්වීපයේ කම්කරු පන්තිය හා පීඩිත මහජනතාවන් සඳහා ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කරමින් දකුනු ආසියාවේ කම්කරු පන්තිය තුල ගැඹුරට මුල් විහිදුවාගත්හ. බීඑල්පීඅයි ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සමග ඒකාබද්ධ වූ අතර පසුව 1964 දී ලසසප ධනේශ්වර හවුල් ආන්ඩුවකට ඇතුලු වීම, සමාජවාදයට හා මෙරට කම්කරු පන්තියේ එකමුතුවට එල්ලවූ දැවැන්ත පහරක් විය.

සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) ලසසප පාවාදීමට එරෙහිව සෘජු දේශපාලන අරගලයක් තුල හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ලංකා ශාඛාව ලෙස 1968 වසරේදී පිහිටුවන ලදි. දශක හතරකට වැඩි කාලයක් තිස්සේ විකොස හා සසප ධනේශ්වර වර්ගවාදයට, එනම්, සිංහල රාජ්‍ය භාෂාව ලෙස හා බෞද්ධාගම රාජ්‍ය ආගම ලෙස ඔටුනු පැලඳවීමටත් ජවිපෙ ව්‍යාජ-ජනතාවාදී සිංහල ස්වෝත්තමවාදයටත් එල්ටීටීඊ බෙදුම්වාදයටත්, අශමනීය ලෙස විරුද්ධ වී තිබේ. සිවිල් යුද්ධයට විරුද්ධවත්, උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත් කිරීම සඳහාත් එක දිගටම සටන් වැද ඇති පක්ෂය විකොස/සසප පමනි. දකුනු ආසියාවේත් ජාත්‍යන්තරවත් පන්ති අරගලය යලි හිස ඔසවන තතු

හමුවේ මෙම අරගලයන්ගේ පාඩම් කම්කරු පන්තිය සඳහා අත්‍යවශ්‍ය දේශපාලන මංසලකුනු සපයාදෙනු ඇත.

මෙරට කම්කරු පන්තියේ නව මහජන පක්ෂය ලෙස සසප ගොඩනැගීම අද දිනයේ හදිසි කර්තව්‍යය බවට පත්වෙයි. අපගේ ක්‍රියාමාර්ගයට හා ඉදිරිදර්ශනයට සහාය දක්වන සියල්ලන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, අපගේ මැතිවරන ව්‍යාපාරයට ක්‍රියාශීලී ලෙස සම්බන්ධ වන ලෙසයි. මෙහි තේරුම, අපගේ අපේක්ෂකයන් හා රැස්වීම් පිලිබඳ ප්‍රචාරය කරනු පිනිස සහයෝගය දීමත්, අපගේ මැතිවරන ලිපි ලේඛන බෙදාහරිමින් සාකච්ඡා සංවිධානය කිරීමත්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අන්තර්ජාල ප්‍රකාශනය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පරිශීලනය කරන ලෙසට හැකිතාක් පුලුල් ප්‍රේක්ෂකයන් සංඛ්‍යාවක් දිරිගැන්වීමත් ය. සියල්ලටත් වඩා සමාජවාදී සමානතා පක්ෂයට බැඳී කම්කරු පන්තියේ මහජන පක්ෂය ලෙස එය ගොඩනැගීමට එක් වන ලෙස අපි ඔබට ඇරයුම් කරන්නෙමු.

© www.wsws.org